**ඇලහැර ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 10 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

--------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයගැතියන් රු. 18,017,398 ක් වශයෙන් සඳහන් වුවද, ලේඛන අනුව එම ශේෂය රු. 19,333,066 ක් වූයෙන්, කර්මාන්ත ණයගැතියෝ රු. 1,915,668 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පුස්තකාල ගොඩනැගිල්ල, සායන මධ්‍යස්ථානය හා සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම සඳහා 2010 අගෝස්තු 10 දින ආරම්භ කරන ලද ඉතිරිකිරීමේ ගිණුමේ රු. 179,200 ක මුදල, මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් රු. 20,300,065 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයන්ගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තු රු. 202,794 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ණයගැති වටිනාකමෙන් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් අංක 4 යටතේ ඇති සේවා සඳහා ගාස්තු ආදායම රු. 3,008,063 ක් වුවත්, ආදායම් හා වියදම් ගිණුම අනුව එය රු. 2,830,322 ක් වශයෙන් දැක්වීම නිසා, ආදායම් හා වියදම් ගිණුමේ ජල ගාස්තු ආදායම රු. 177,741 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 4,988,820 ක් වූ අතර, ඉන් රු. 1,898,265 ක මුදලක් 2012 වර්ෂයේ සිට සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරිමට ආදල සභා දායකත්වය වශයෙන් ගෙවිය යුතු මුදලක් බව නිරික්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 95,016,064 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

--------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත කාර්ය පටිපාටිත රීති III පරිච්ඡේදයේ 23(1) වගන්තිය | ලේකම් තනතුරේ රාජකාරි ඉටුකිරිම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් 2013 ජුනි 03 දින සිට වැඩබලන ලේකම් වරයෙකු පත්කර ඇතත්, එම පත්වීම සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අදාල අනුමැතිය ලබාදී නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
---------------------------------------

| | |
|---|---|
| මු.රෙ. 571 | රු. 260,000 ක් වටිනා වර්ෂ 2 ක කාලයක් ඉක්මවූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂ 52 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් කඩ කාමර 50 ක් වෙනුවෙන් අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩකුලී සංශෝධනය කළයුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි. |

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

**--------------------**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 24,661,407 ක් වූ අතර ඉන් රු. 153,774 ක මුදලක් වර්ෂ 5 කට අධික කාලයක සිට හිඟහිටි ආදායම් වශයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිගින් දිගටම අනාවරණය වන, හඳුනා නොගත් ශේෂයක් ලෙස දක්වා තිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය.**

**------------------------**

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 437,239 ක් වූ අතර ඊට අනුරූපීව, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 668,845 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 1,065 | 650 | 550 |
| (ii) බදු කුලී | 10,975 | 2,192 | 557 |
| (iii) බලපත්‍ර ගාස්තු | 490 | 68 | - |
| (iv) වෙනත් ආදායම් | 37,284 | 23,384 | 35,232 |

2.2.2 වරිපනම් බදු

-----------------

බදු කරුවන් 55 දෙනෙකුගෙන් වර්ෂ 5 කට අධික කාලයක සිට අය නොවී පවතින රු. 576,571 ක හිඟ වරිපනම් බදු මුදලක් අයකර ගැනීම කෙරෙහි සභාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

2.2.3 කඩ කාමර කුලී

---------------------

බකමූණ, ඇලහැර කඩ කාමර 13 කින් වර්ෂයකට වඩා කුලී අය නොවී හිඟව පවතින රු. 219,182 ක මුදලක් අයකර ගැනීම කෙරෙහි සභාව විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 2,702,975 ක්ද, මුද්දර ගාස්තු රු. 666,500 ක්ද විය..

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු වටිනාකම රු. 1,707,175 ක් වන කැබ් රථයක්, සහල් පිටි නිෂ්පාදන කට්ටලය හා එම ගොඩනැගිල්ල වර්ෂ 5 – 7 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතින.

3.2 කොන්ත්‍රාත් පාලනය

-------------------------

(අ) මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කුට්ටි ගල් අතුරා මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජයසිරිපුරපිටිය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, සමෘද්ධි සංවර්ධන සමිතියකට 2014 ජුනි 15 දින රු .498,569 ක මුදලකට ගිවිසුම අත්සන් කර භාරදී තිබුණු නමුත්, අදාල කාල සීමාව තුළ කොන්ත්‍රාත්කරු එම කර්මාන්තය ඉටුකර නොතිබුණු අතර විගණන දිනය වූ 2015 ජුලි 20 දින වන විටත්, සභාව ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂවල ඉටුකරන ලද රු. 7,960,164 ක් වටිනා මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ, මාර්ග පිළිසකර කිරීමේ කොන්ත්‍රාත් 16 ක අවසන් මුදල් ගෙවීමේදී, අදාල කොන්ත්‍රාත්කරුවන්ට සියයට 10 ක අත රඳවීමකින් තොරව, සම්පූර්ණ මුදලම ගෙවීම් කර තිබුණු නමුත් අදාල කාල සීමාව තුළ එම කර්මාන්ත නිසි තත්ත්වයෙන් පවතින බව තාක්ෂණ/කාර්මික නිලධාරියෙකුගේ සහතික කිරිමක් ලබා නොගෙන නොතිබුණි.

3.3 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය